# බුදුරජාණන් වහන්සේගේ විවිධ දේශනා ක්‍රම

කඹුරුගමුවේ ගුණරතන හිමි

බුදුරජාණන් වහන්සේ දෙව් - මිනිසුන්ගේ දෙලොව යහපත සඳහා පන්සාලිස් වසක්ම චාරිකා වෙහි හැසිරෙමින් ධර්මදේශනා කළබව අපි දනිමු. මේ කාලය තුළ උන්වහන්සේ අනේකවිධ ආකාර යෙන් එය කළබව ත්‍රිපිටක සාහිත්‍යයෙන් පෙනේ. මහා පරිනිබ්බාන සූත්‍රයෙහි සඳහන් පරිදි අටවැදෑරුම් පිරිස් වෙත එළඹීමේදී අනුගමනය කළ ක්‍රම මෙසේ දැක්වේ. ''තත්‍රපි මයා සන්නිසින්න පුබ්බඤ්ච සල්ලපිත පුබ්බඤ්ච සාකච්ඡා ච සමාපජ්ජිත පුබ්බා තත්ථ යාදිසකො තෙසං වණ්ණො හොති. තාදිසකො මයහං වණ්ණො හොති. තාදිසකො තෙසං සරො හොති තාදිසකො මය්හං සරො හොති.''[1] එම ක්ෂත්‍රිය ආදී මහ පිරිසගේ ශරීර වර්ණය ගැනීමත් ඔවුන්ගේ භාෂාව ගැනීමත් මෙහිදී දක්නා ලැබේ.

බුදුරදුන්ගේ දේශනා විලාශ වැඩි ප්‍රමාණයක් දක්නට ලැබෙන්නේ සූත්‍ර පිටකයෙහිදීය. විනය පිටක යෙන් අනුන් හට දහම් දෙසීමේදී අනුගමනය කළයුතු පිළිවෙත් ද දහම් දෙසිය යුතු පුද්ගලයන් ද දක්නට ලැබෙන අතර අභිධර්ම පිටකයෙහි ඇතුළත් වන්නේ නැණැතියන් හට පමණක් විෂය වූ ගැඹුරු දහම් කොටස් පමණකි. උන්වහන්සේගේ දේශනා ද්විවිධ, ත්‍රිවිධ, චතුර් විධ, ආදී වශයෙන් ආකාර කීපයකි. ''ද්වෙ භගවතො දෙසනා: පරමත්ථ දෙසනා ච ඛන්ධාදිවසෙන, සම්මුති දෙසනා ච සප්පිකුම්භාදි වසෙන ච''[2] යනුවෙන් පළමුකොට පරමාර්ථ හා සම්මුති වශයෙන් දක්වයි. පරමාර්ථ දේශනා නම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ස්කන්ධ ධාතු ආයතනාදී වශයෙන් කළ දේශනායි. සම්මුති දේශනා නම් සත්වයාය, පුද්ගලයාය, ස්ත්‍රියය, පුරුෂයාය, දෙවියාය, මනුෂ්‍යයාය ආදී වශයෙන් කළ දේශනායි. අංගුත්තර නිකායෙහි ''ද්වෙ මෙ භික්ඛවෙ තථාගතස්ස ධම්මදෙසනා සංඛිත්තෙන ච විත්ථාරෙන ච''[3] යනුවෙන් සංක්ෂේප විස්තාර වශයෙන් දෙකොටසක් දක්වයි. සංක්ෂේප යනු මාතෘකාව පමණක් දේශනාකොට දැක්වීමයි. විස්තාර නම් එකින් එක කරුණු ගෙනහැර පාමින් කරන දේශනාවයි. සංක්ෂේප වශයෙන් දෙසනුයේ ප්‍රඥාවන්තයන් හටය. අල්ප ප්‍රාඥයන්හට විස්තාර දෙසුම වේ. එකංසිකා දේශනා, අනෙකංසිකා දේශනා යැයි තවත් ද්විවිධ දේශනා ක්‍රමයක් වේ. මේ දුකය, මේ දුක හටගැනීමේ හේතුවය, මේ දුක නැසීමය, මේ දුක නැසීමේ හේතුවය යනුවෙන් ඒකාන්ත කොට කළ දේශනා එකංසිකා දේශනා වන අතර ලෝකය ශාස්වතය, අශාස්වතය, අන්තවත්ය, අනන්තවත්ය, ආදී වශයෙන් ඒකාන්ත නොකොට කළ දේශනා අනෙකංසිකා දේශනා නමි. ත්‍රිවිධාකාර වශයෙන් වොහාර දේශනා, පරමාර්ථ දේශනා, ආණා දේශනා යනුවෙන් දැක්වේ. මුලින් දැක්වූ සම්මුති හා පරමාර්ථ දේශනා පිළිවෙලින් වොහාර දේශනා පරමාර්ථ දේශනා ලෙස ගතයුතු අතර භික්ෂු-භික්ෂුණීන් උදෙසා පැනවූ පරාජිකාදී ශික්ෂා පද ආණා දේශනා නම් වෙති. ම. නි. මහා සකුළුදායී සූත්‍රයේදී ධර්මදේශනා කරන තවත් ආකාර 3 ක් දැක්වේ.

1. සනිදානං සමණො ගොතමො ධම්මං දෙසෙති නො අනිදානං
2. අභිඤ්ඤය සමණො ගොතමො ධම්මං දෙසෙති නො අනභිඤ්ඤාය.
3. සප්පටිහාරියං සමණො ගොතමො ධම්මං දෙසෙති නො අප්පටිහාරියංති.[4]

බුදුරජාණන් වහන්සේ නිදාන සහිතව මිස නිදාන රහිතව නොව, අභිඥාව පිණිස මිස අනභිඥාව පිණිස නොව, ප්‍රත්‍යනීක ධර්මයන් නෙරලීම් සහිතව මිස එය රහිතව දේශනා නොකරන බවත් වදාළහ. උන්වහන්සේගේ ධර්මය මුල, මැද, අග, යන ත්‍රිවිධ ස්ථානයන්හි පිරිසිඳු බව බෞද්ධ සාහිත්‍යයෙහි ''සො ධම්මං දෙසෙති ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේති'' යන්නෙන් පැහැදිලි වේ.

අටුවාචාරීන් වහන්සේලා දක්වන පරිදි ත්‍රිපිටක දේශනා සියල්ලම කොටස් 4 කට බෙදයි.

1. අත්තජ්ඣාසය
2. පරජ්ඣාසය
3. පුච්ඡාවසික
4. අට්ඨුප්පත්තික වශයෙනි.

තමන් වහන්සේගේ අදහස අනුව අනාරාධිතව කළ දේශනා අත්තජ්ඣාසය වශයෙන්ද යම් යම් අයගේ අදහස් අනුව කළ දේශනා පරජ්ඣාසය වශයෙන්ද යම් කිසිවකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දීම් ලෙස කළ දේශනා පුච්ඡාවසික වශයෙන් ද යම් කාරණයක් පැමිණි කල ඒ අනුව කළ දේශනා අට්ඨුප්පත්තික වශයෙන්ද අර්ථකථාචාරීහු දක්වති.

ලෝකයෙහි විවිධ වූ විෂම වූ පුද්ගලයන් ඇති හෙයින් බුදුරදුන් හට එකම අයුරකින් දහම් දෙසීමට අපහසු විය. ඒ ඒ පුද්ගලයන්ගේ චරිතානුකූලව සොයාබලා එසේ කිරීමට උන්වහන්සේට සිදුවිය. විසුද්ධිමාර්ගයෙහි පුද්ගල චරිත 6 ක් දක්නා ලැබේ.[6]

1. රාග චරිත
2. ද්වේෂ ,,
3. මොහ ,,
4. ශ්‍රද්ධා ,,
5. බුද්ධි ,,
6. විතර්ක ,, වශයෙනි.

තෘෂ්ණාව අධික වූයේ රාග චරිතයායි. කාම යන්හි ආදීනව දක්වන අලගද්දූපම සූත්‍ර මෙවැනි චරිත ඇත්තවුන් හට දෙසන ලදී. ක්‍රෝධය බහුල වූයේ ද්වේෂ චරිතයායි. මෛත්‍රියේ ගුණ ප්‍රකාශ කෙරෙන කරණීය මෙත්ත සූත්‍රය වැනි දේ ඔවුන් උදෙසා දේශිතය. අවිද්‍යාව අධික වූයේ මෝහ චරිතයායි. සිහිය පිහිටුවා ගැනීම් වස් මහා සතිපට්ඨාන වැනි සූත්‍ර ඔවුනට දේශිතය. ශ්‍රද්ධා චරිතයනට තුනුරුවන්ගේ ගුණ කියැවෙන දේශනා ද බුද්ධි චරිතයනට අභිධර්මය වැනි ගැඹුරු දේශනා ද විතර්ක චරිතයනට විතක්කසණ්ඨාන සූත්‍ර වැනි දේශනා ද දේශිතය. එපමණක් ද නොව භාවනානුයෝගී පුද්ගලයන්ට කර්මස්ථාන දීමේදී ඒ ඒ චරිතාධිමුක්තීන් අනුව ද වදළහ.

බුදුරජාණන් වහන්සේ උපමා - රූපක අලංකාර යන්ගේ මාර්ගයෙන් ද දෙව් - මිනිසුන්හට ධර්මය අවබෝධ කරවීමට උත්සාහ ගෙන ඇති බව සූත්‍ර පිටකයෙහි කීප තැනකදීම දක්නට ලැබේ. ම. නි. ඔපම්ම වර්ගයෙහි මෙවැනි තැන් කොතෙකුත් දැකගත හැකිය. අලගද්දූපම සූත්‍රයෙහි කාමයන්ගේ ආදීනව යන් ප්‍රකාශ කරමින් අට්ඨිකඞ්ඛලූපමා කාමා-මංසපේසූපමා කාමා - තිණුක්කූපමා කාමා - අඞ්ගාර කාසූපමා කාමා - සුපිනකූපමා කාමා - යාචිතකූපමා කාමා - රුක්ඛඵලූපමා කාමා - අසිසූපමා කාමා යනුවෙන් ඇටසැකිල්ල, මස්කැටිය, තණසුළ, අඟුරුවල සිහිනය, ඉල්වාගත් දෙය, ගසක ඵලය, මස් ලොඹුව ආයුධය, සර්ප හිස යන මේවාට උපමා කොට ඇත. රථ විනීත සූත්‍රයේදී සප්ත විශුද්ධීන්හි එකිනෙකට ඇති සම්බන්ධය දක්වනු සඳහා රථ 7 ක් ගෙන කළ උපමා ද පහාරාද සූත්‍රයෙහි ශාසනය ක්‍රම ක්‍රමයෙන් ගැඹුරු බව වටහා ගනු සඳහා මහ සසුරෙහි දක්වූ ගුණ ද මෙහිදී වැදගත් සේ සැළකිය යුතුය.

උන්වහන්සේ මෙසේ උපමා තෝරා ගත්තේ අර්ථෝද්දීපනය සඳහා පමණක් නොව ප්‍රතිවාදියාගේ තර්කයෙහි අවිචාරවත් බව දැක්වීම සඳහාය යන්න කසීභාරද්වාජ සූත්‍රයේ මැනවින් පැහැදිලි කරයි. "අහම්පි සමණ කසාමිච වපාමිඡ, කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි, ත්වම්පි සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සුති." මහණ මම සී සාමි. වපුරමි. සී සා වපුරා අනුභව කරමි. ඔබ ද සී සා වපුරා අනුභව කරව'යි කසීභාරද්වාජ බමුණා බුදුරදුන්ට සැළ කළේය. එවිට උන්වහන්සේ මෙසේ වදලහ.

සද්ධා බීජං තපොවුට්ඨි —
පඤ්ඤාමෙ යුග නඞගලං
හිරි ඊසා මනො යොත්තං —
සති මෙ පාල පාචනං !

බමුණ මම ද ගොවිකම් කරමි. ශ්‍රද්ධාව මගේ බීජයයි. තපස වැස්සයි, ප්‍රඥව නම් වියගහ සහ නගුලයි. ලජ්ජාව නගුලිසයි. සිත යොතය සිහිය සීවැල හා කෙවිටය ආදී වශයෙනි. මෙවැනි අවස්ථාවලදී ශ්‍රාවකයන් හට කොතරම් අවබෝධයක් ලැබුනේ ද යන්න නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූලහස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙවා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛු මන්තෝ රූපානි දක්ඛිත්ති ති[7] මෙ වාක්‍ය ඛණ්ඩයන්ගෙන් පැහැදිලිවේ.

එසේම උන්වහන්සේ නොයෙක් පර්යායෙන්ද ධර්මය වදලහ. "අනෙක පරියායෙන ධම්මෝ පකාසිතො"[1] යනුවෙන් ඒ බව බෞද්ධ සාහිත්‍යයෙහි කීප තැනකම පෙනේ. මධු පිණ්ඩික පරියාය, අලගද්ද පර්යාය, ආදිත්ත පරියාය ආදී වශයෙන් මජ්ඣිම නිකායෙහි පර්යාය සූත්‍ර ධර්ම ඇතුලත්වේ. මධු පිණ්ඩික සූත්‍රයෙහිදී මී වදය කිනම් පැත්තකින් රස බැලුවත් එහි සෑම තැනකම මිහිරි රසයක් ගෙන දෙන්නාක් මෙන් ධර්මය ද නුවණින් පිරික්සීමෙන් චිත්තප්පසාදයම ලැබේ යනු පර්යායයි.

මෙසේ උන්වහන්සේ ධර්මදේශනා කිරීම් විෂයෙහි බොහෝ ප්‍රකාරයන් අනුගමනය කළ බව මැනවින් පැහැදිලි වේ.

1. දි. නි. මහා පරිනිබ්බානසුත්ත.
2. පඤ්චප්පකර ණට්ඨ කථා 103 පිට.
3. අංගුත්තර නිකාය දුක නිපාතය.
4. ම. නි. මහා සකුළුදායී සුත්ත.
5. දි. නි. සීලක්ඛන්ධ වග්ග සාමඤ්ඤඵල සුත්ත.
6. විසුද්ධි මාර්ගය කර්මස්ථාන නිර්දේශය.
7. සුත්ත නිපාත කසීභාරද්වාජ සුත්ත.
8. ම. නි. අනඞගන සුත්ත (3) එම......